# සිංහල

## 5 ශ්‍රේණිය





Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# පාඩම 13 – 'ත්' යොදා වැකි ලියමු.

## පියවර 1

- පහත වැකි හඬ නගා කියවමු.

1. අම්මා ගෙමිදුල සකස් කරයි.

   තාත්තා ගෙමිදුල සකස් කරයි.

   <u>අම්මාත් තාත්තාත් ගෙමිදුල සකස් කරති.</u>

2. ගුරුතුමිය හොඳින් උගන්වයි.

   ගුරුතුමා හොඳින් උගන්වයි.

   <u>ගුරුතුමියත් ගුරුතුමාත් හොඳින් උගන්වති.</u>

- දැන් මේ වැකි 'ත්'යොදා සම්බන්ධ කළ විට සෑදෙන වාක්‍යයේ අවසාන ක්‍රියාව බහු වචන බව ඔයාට තේරෙනවා නේද?
- ඒ අනුව පහත වැකි 'ත්' යොදා එක් වැකියක් සේ අපි ලියමු.

1. නවීන් ගත් දෙයක් තිබූ තැනින් ම තබයි.

   කවිඳු ගත් දෙයක් තිබූ තැනින් ම තබයි.

   රවිඳු ගත් දෙයක් තිබූ තැනින් ම තබයි.

❖ ..........................................................................................................

2. මුවා වටපිටාව පිළිබඳ ව විමසිලිමත් වෙයි.

   මුව දෙන වටපිටාව පිළිබඳ ව විමසිලිමත් වෙයි.

   මුව පැටියා වටපිටාව පිළිබඳ ව විමසිලිමත් වෙයි.

❖ ..........................................................................................................

3. අම්මා අවුරුදු චාරිත්‍ර ඉටු කරයි.

   තාත්තා අවුරුදු චාරිත්‍ර ඉටු කරයි.

   නැන්දා අවුරුදු චාරිත්‍ර ඉටු කරයි.

❖ ..........................................................................................................

## පියවර 2

- නාම පද කිහිපයක් 'යි' යොදා සම්බන්ධ කර වැකි ලියමු.

අපි දැන් පහත දී ඇති වාක්‍ය කියවා අවබෝධ කරගනිමු.

1. අක්කා සිනාසෙයි.

   නංගි සිනාසෙයි.

   <u>අක්කායි නංගියි සිනාසෙති</u>.

2. මල්ලි බෝල ගසයි.

   නංගි බෝල ගසයි.

   <u>මල්ලියි නංගියි බෝල ගසති</u>.

❖ නාම පද දෙකක් යොදා සම්බන්ධ කළ විට අවසාන ක්‍රියාව බහුවචනයෙන් තබන අයුරු ඔබට පැහැදිලියි නේද?

<u>දැනුම පොතට</u>

ගාලු පුරයේ උපත ලද සිබිල් වෙත්තසිංහ පළමුව අධ්‍යාපනය ලැබුවේ ගිංතොට බෞද්ධ මිශ්‍ර පාඨශාලාවෙනි. දෙවනුව බම්බලපිටියේ ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයෙනි.

එච්. ඩී. සුගතපාල මහතාගේ "නවමග" පස් වන ප්‍රමාණයේ කියවීම් පොතට සිබිල් වයස අවුරුදු පහළොවේදී චිත්‍ර ඉදිරිපත් කළාය.

වයස අවුරුදු දහනවයේදී චිත්‍ර ශිල්පිනියක වශයෙන් පුවත්පත් කලාවට පිවිස එදා මෙදා තුර වසර හැටකට වැඩි කාලයක් ළමයින් උදෙසා චිත්‍ර කතා නිර්මාණය කරන්නීය.

එහිදී ඇ විසින් නිර්මාණය කරනු ලැබ ඇති සිංහල, ඉංග්‍රීසි ග්‍රන්ථ සංඛ්‍යාව දෙසීයකට අධිකය.



(කට පාඩම් නොකරන්න. දැනුමට පමණයි.)

- දැන් අපි පහත වැකි එකතු කර ලියමු.

1. මලීෂ තේරවිලි විසඳයි.
   කවීෂ තේරවිලි විසඳයි.

➢ ..................................................................................................................

2. හසිත චිත්‍රය පිළිබඳ ව අදහස් දක්වයි.
   මාධව චිත්‍රය පිළිබඳ ව අදහස් දක්වයි.

➢ ..................................................................................................................

3. රවිඳු ගුවන් විදුලියට සවන් දෙයි.
   පසිඳු ගුවන් විදුලියට සවන් දෙයි.

➢ ..................................................................................................................

4. ගගනි මිහිරි හඬින් ගී ගයයි.
   මිනුකි  මිහිරි හඬින් ගී ගයයි.
   රෂිනි මිහිරි හඬින් ගී ගයයි.

➢ ..................................................................................................................

5. අම්මා රූපවාහිනිය නරඹයි.
   අක්කා රූපවාහිනිය නරඹයි.
   අයියා රූපවාහිනිය නරඹයි.

➢ .................................................................................................................